**පාර්ලිමේන්තු මැතිවරණවලදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මාර්ගෝපදේශ**

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) 2024 සැප්තැම්බර් මස පවත්වන ලද ජනාධිපතිවරනය සාපේක්ෂ වශයෙන් නිදහස්, සාධාරණ සහ සාමකාමී මැතිවරණයක් බව පිළිගනිමු. සුමට අයුරින් බලය හුවමාරු කිරීම සහ පළිගැනීම් සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර පශ්චාත් මැතිවරණ පරිසරය ද ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) අගයමු.

එළැඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ සුදුසුකම් සහිත සියලු දෙනා හට එම අයිතිය භාවිතා කරන ලෙස ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය NCCSL බලවත් ලෙස දිරි ගන්වන්නී ය. එය ඡන්දදායකයනට ආන්තික හා අවදානමට ලක් වූ කණ්ඩායම් හා එක් ව දයාලු බව සහ සහයෝගිතාව පළ කරමින් සියල්ලනට යහපත් රටක් උදෙසා දායක වන්නට හැකි අවස්ථාවකි. එබැවින් "පීඩිතයන්ට හා දිළින්දන්ට ශුභාරංචි ගෙනෙමින්", "සියල්ලෝ පූර්ණ දිවියක්"ලබති ය යන සහතිකය සහිත යථාර්ථවාදී ප්‍රතිපත්ති ඇතුළත් පරමාදර්ශ අරබයා දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ ඒ ඒ අපේක්ෂකයින්ගේ කැපවීම ගැන සියලු ඡන්දදායකයින් සිය අවධානය යොමු කළ යුතුය.

නීති සම්පාදනය කිරිම වනාහි පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යයකි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සහ අනුමත කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) සහ මාර්ගගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (OSA) වැනි අසාධාරණ සහ මර්දනකාරී නීති අහෝසි කිරීම, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) වැනි පවත්නා නීති සංශෝධනය කිරීම මෙන්ම නව නීති පැනවීම ද මෙයට ඇතුළත් වේ. පාර්ලිමේන්තුව සතු තවත් ප්‍රධාන කාර්යයක් වනුයේ අයවැය සම්මත කිරීමයි. මෙම භාරදූර කාර්යයන් ඉටු කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දක්ෂ විය යුතුය. ක්‍රියාත්මක විය හැකි බහුතරයක් සහිත ස්ථාවර ආණ්ඩුවක් තිබීම ඉතා වැදගත් යැයි ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) සලකන නමුත් අතීතයේ දී මෙන් පාර්ලිමේන්තුවේ 2/3 හෝ 5/6 වැනි අධික බලයක් ලබා දීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අඩපණ කළ හැකි බව විශ්වාස කරයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට අත්‍යවශ්‍ය වන ශක්තිමත්, ප්‍රතිපත්තිගරුක, නිපුණ සහ බහුත්වවාදී විපක්ෂයක වැදගත්කම ද ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) පිළිගනී.

තරුණ, වඩා දක්ෂ සහ ප්‍රතිපත්තිගරුක අපේක්ෂකයින්ට පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වීමට මෙවර ලැබී ඇති අවස්ථාවන් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) අගයන අතර පළපුරුදු සහ තරුණ අපේක්ෂකයින් දෙපිරිස ගැනම සලකා බලන ලෙස ඡන්දදායකයින්ගෙන් ඉල්ලා සිටිමු. ව්‍යවස්ථාදායකයේ කාන්තා මන්ත්‍රීවරියන් සංඛ්‍යාව වැඩි කිරීම වැදගත් බව ද ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) විශ්වාස කරනුයේ, කාන්තා මන්ත්‍රීවරියන් ඉදිරිපත්වීම හා සහභාගීත්වය විවිධ ආකාරවලින් ව්‍යවස්ථාදායකවල ගුණාත්මක භාවය ඉහළ නංවන්නට පාදක වී ඇති බව ජාත්‍යන්තර අත්දැකීම් වලින් ද පෙන්නුම් කරන බැවිනි.

පහත දැක්වෙනුයේ කවරෙකු හට ඡන්දය භාවිත කළ යුතු ද යන්න තීරණය කරනු පිණිස, මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කළ හැකි රාමුවකි. එය අවධානය යොමු කළ යුතු සහ වැදගත් අංශ කිහිපයක් ඉස්මතු කිරීමට උත්සාහ කරයි.

**1. ප්‍රධාන කාරණා සම්බන්ධව ස්ථාවරයන්, ප්‍රතිපත්ති හා සැලැසුම් - අතීතය, වර්තමානය සහ අනාගතය**

i. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කිරීම - විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, එක්සත් රටක (ඒකීය නොවන) රාමුවක් තුළ බලය බෙදා ගැනීම ඇතුළුව අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය යනාදී සුරකිමින් ජනවාර්ගික අර්බුධයට ආමන්ත්‍රණය කිරිම.

ii. නීතිපති කාර්යාලයේ ප්‍රතිසංස්කරණ, පොලිස් දෙපාර්තමෙන්තුවේ ප්‍රතිසංස්කරණ සහ සිවිල් ක්‍රියාකාරකම්වලට හමුදාව සම්බන්ධ වීම සීමා කිරීම.

iii. ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල සහ තීරණ ගැනීමේ දී වැඩි කාන්තා නියෝජනය ප්‍රවර්ධනය කිරීමේ පියවර ගැනිම.

iv. ආර්ථික අර්බුදය ආමන්ත්‍රණය කිරීම - ණය ප්‍රතිව්‍යුහගත කිරීම හෝ අවලංගු කිරීම, තිරසාර සංවර්ධනය, සියල්ලන්ටම සාධාරණ වැටුප් ලබාදීම.

v. ප්‍රතිසන්ධානය - සියල්ලන්ට තම නැසිගිය අයවළුන් අනුස්මරණ අයිතිය සහතික කිරීම, ප්‍රජාව අතර සහ ප්‍රජාව හා රාජ්‍ය ආයතන අතර ඉඩම් ආරවුල් සමථයකට පත් කිරීම.

vi. අතීත අපරාධ හා මානව අයිතීන් කඩ කිරීම් ආමන්ත්‍රණය කිරීම - යුද සමයේ ම්ලේච්ඡ ක්‍රියාකාරකම්, පාස්කු ඉරිදා ප්‍රහාරය, ආර්ථික අපරාධ, බලහත්කාර අතුරුදහන් කිරීම්, නීති විරෝධී මරණ දණ්ඩන, බන්ධනාගාර සමූලඝාතන, ජනමාධ්‍ය හා ජනමාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සහ විරුද්ධ අදහස් දැක්වීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ක්‍රියාත්මක කිරීමේදී පීඩාවට පත් වූවන් හට යුක්තිය ඉටු කිරිම.

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org

vii. ආන්තික පිරිස්වල හා ඓතිහාසික ව වෙනස් කොට සැලැකීම්වලට ලක්වූවන්ගේ අයිතීන් - මලයහ ප්‍රජාව, විධිමත් හා අවිධිමත් අංශවල වැඩ කරන ජනතාව, ගොවීන්, ධීවරයන්, වෙනස් ස්ත්‍රී - පුරුෂ අනන්‍යතා සහ ලිංගික ආස්ථාන සහිත පිරිස්, ළමයින් හා ආබාධිත ස්ත්‍රීන්, පුරුෂයන්, ආදිවාසීන් වැනි.

viii. පරිසර සුරක්ෂණය හා පෝෂණය ගැනත්, දේශගුණික විපර්යාස ගැනත් සැලැකිලිමත් වීම.

ix. විදෙස් සබඳතා - ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා පිළිබඳ ව හා සරණ හා ආරක්ෂා පිණිස මෙහි පැමිණෙන්නන් අරබයාත්, පලස්තීනය වැනි ගෝලීය ගැටළු සම්බන්ධයෙනුත් තම ස්ථාවරයන්.

**2. මානව හිමිකම් කඩ කිරීම්වලට, ජාතිවාදයට, දූෂණයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධ වීම**

i. අපේක්ෂකයන් අධිකරණවලින් හෝ වෙනත් විනිශ්චය ආයතනවලින් හෝ (නිදසුන්ඃ මානව හිමිකම් කොමිසම) අපරාධ වැරැදිවලට හෝ මානව අයිතීන් කඩකිරීම්වලට හෝ වරදකරුවන් වී ඇද්ද යන වග,

ii. කිසියම් සාපරාධී වරදක්, වංචා දූෂණයක් හෝ මානව හිමිකම් කඩ කිරීමක් සම්බන්ධයෙන් අපේක්ෂකයන්ට එරෙහි ව විභාග වන පරීක්ෂණ හෝ අධිකරණ නඩු හෝ තිබේ ද යන වග,

iii. ව්‍යවස්ථාව හෝ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන් හී සම්මතයන් හැල්ලුවට ලක් කිරීමට අපේක්ෂකයින් සම්බන්ධ වීම පිළිබඳව විශ්වාසදායක චෝදනා සහ තොරතුරු තිබේ ද යන වග,

iv. අපේක්ෂකයන්ට එරෙහි ව ජාතිවාදී හා වෛරී ප්‍රකාශන සිද්ධීන් වලට සම්බන්ධ වීම ගැන විශ්වාස කටයුතු චෝදනා වේ ද යන වග,

v. අපේක්ෂකයන් මැතිවරණ නීති කෙරෙහි වන ගරුත්වයේ ප්‍රමාණය හා ඒ කෙරෙහි වන විශ්වාසය හා උනන්දුව,

**3. දේශපාලනයෙහි නියැලීමේ හා අනෙක් වගකිව යුතු තනතුරු දැරීමේ දී අපේක්ෂකයන්ගේ හැසිරීම්**

i. අපේක්ෂකයන් මහජන නියෝජිතයන් ලෙස තේරී පත් වූ විට දී ඔවුන්ගේ කාර්ය සාධනතා.

ii. සිවිල් සමාජය සමග ගනුදෙනු කිරීමේදී අපේක්ෂකයින්ගේ කාර්ය සාධනතා.

iii. පෞද්ගලික ධනය, වෙසෙසින් වත්කම් ප්‍රකාශයට පත් කිරීම ඔස්සේ අපේක්ෂකයන්ගේ විනිවිද භාවයට ඇති කැමැත්ත හා කැපවීම.

iv. පරාජිත අපේක්ෂකයින්ට "ජාතික ලැයිස්තුව" හරහා පාර්ලිමේන්තුවට පැමිණීමට ඉඩ නොදීමට දේශපාලන පක්ෂවල කැපවීම.

v. මනාප ලබාගැනිම සඳහා අශෝබන ගැටුම් ඇති නොවීමට දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින්ගේ කැපවීම.

**ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියා පටිපාටිය**

▪ ඡන්දය භාවිත කිරීමේ සුදුසුකම් සහිත පුරවැසියකුට තම ඡන්දය ප්‍රකාශ කිරීම පිළිබඳ ව යම් සැකයක් ඇත්නම් අදාළ නිලධරයන් මාර්ගයෙන් කල්වේලා ඇති ව උපදෙස් ලබා ගත හැකි යි.

▪ සියලුම ඡන්දදායකයින් හට තමන් කැමති දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම තෝරාගෙන පසුව තමන් කැමති අපේක්ෂකයින් වෙත 1, 2, 3 යනාදි වශයෙන් මනාප දැක්වීමට හැකි යි.

▪ මැතිවරණ දිනයේදී හැකි තාක් උදෑසනින් ඡන්ද පොළට ගොස් තම ඡන්දය ප්‍රකාශ කිරීමට ඡන්දදායකයන් උනන්දු විය යුතු ය.

**නිගමනය**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් "පරමාධිපත්‍යය ජනතාව සතු ය, එය අහිමි කළ නොහැකි ය, එයට ආණ්ඩුවේ බලතල, මූලික අයිතීන් සහ ඡන්ද බලය ඇතුළත් ය" යන්න පිළි ගන්නා බැවින් සිය ඡන්ද බලය වගකීම්සහගත ව භාවිත කරන මෙන් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය NCCSL ශ්‍රී ලාංකිකයන්ගෙන් උදක් ම ඉල්ලා සිටින්නී ය.

**2024-11-01**

**අත්සන් තබන ලද්දේ :**
අති ගෞරවණීය නිෂාන්ත ප්‍රනාන්දු රදගුරුහිමි, සභාපති - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය,
අති ගෞරවණීය දුෂාන්ත රොඩ්රිගෝ රදගුරුහිමි, කොළඹ රදගුරුතුමා, ලංකා සභාව, කොළඹ දියෝකීසිය,
අති ගෞරවණීය ආචාර්ය V. පද්මදයාලන් රදගුරුහිමි, යාපනය දියෝකීසිය, දකුණු ඉන්දීයානු සභාව,
ගෞරවණීය කිංග්ස්ලි වීරසිංහ දේවගැතිතුමා, මහානායක, ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාව,
ගෞරවණීය ලක්මාල් විජේරත්න සහකාර දේවගැතිතුමා, සභාපතිතුමා, ශ්‍රී ලංකා ක්‍රිස්තියානි රෙපරමාදු සභාව,
ගෞරවණීය විලි රණසිංහ දේවගැතිතුමා, සභාපතිතුමා, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව,
ගෞරවණීය සමන් පෙරේරා දේවගැතිතුමා, සභාපතිතුමා, ශ්‍රී ලංකා ප්‍රෙස්බිටීරියානු සභාව,
කර්නල් නිහාල් හෙට්ටිආරච්චි, ප්‍රාදේශිය මූලිකතුමා, ශ්‍රී ලංකා ගැළවීමේ හමුදාව,
ගෞරවණීය ක්‍රිෂෝකුමාර් හැන්ඩි දේවගැතිතුමා, සභාපතිතුමා, ලංකා දේවසභාව,
ගෞරවණීය හරිම් පීරිස් දේවගැතිතුමා, වැඩබලන සභාපතිතුමා, සිවුචතුරස්‍ර දේවසභාව

තරුණ ක්‍රිස්තියානි සංගමය, තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය, ශ්‍රී ලංකා ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපාරය, ශ්‍රී ලංකා බයිබල් සංගමය, ක්‍රිස්තියානි සාහිත්‍ය සංගමය, ජීවිතාලෝකය, ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය පිළිමතලාව, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, යෞවන කිතුමග,

ගෞරවණීය සුජිතර් සිවනායගම් දේවගැතිතුමා, මහා ලේකම්, - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL)